සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2017

## 10 ශ්‍රේණිය

## නාට්‍ය හා රංග කලාව - I පත්‍රය

නම/විභාග අංකය :- ..............................................................................

කාලය : පැය 01 යි.

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

(1) නාට්‍යයක් නැරඹීම මගින් ප්‍රේක්ෂකයාට වැදගත්වන්නේ
(i) ජීවිතාවබෝධයක් ලබාදේ.
(ii) නාට්‍යකලාව පිළිබඳව දැනුමක් ලබාදේ.
(iii) සිදුවීම පෙළගැස්වීම පිළිබඳව දැනුමක් ලබාදේ.
(iv) නළු නිළියන් පිළිබඳව වැටහීමක් ලැබේ.

(2) ප්‍රාසාංගික කලා මාධ්‍යයක් නොවන්නේ,
(i) නාට්‍යය (ii) සංගීතය (iii) චිත්‍රපට (iv) නර්තනය

(3) දෘශ්‍ය කලා මාධ්‍ය පමණක් වන්නේ,
(i) චිත්‍ර, නර්තන, ඔපෙරා
(ii) කාටූන් රූපවාහිනී නාට්‍ය, මූර්ති
(iii) චිත්‍ර, බැලේ, මුද්‍රා
(iv) මූර්ති, කැටයම්, චිත්‍ර

(4) ගැඹුරු හැඟීමන් නිර්මාණය වෙනස් කළ හැකි කලා විෂය වන්නේ,
(i) නවකතාව (ii) නාට්‍යය (iii) සංගීතය (iv) නර්තනය

- පහත තොරතුරු ඇසුරු කරගෙන ප්‍රශ්න අංක 5 සිට 7 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A. සොකරි
B. භරත නැටුම
C. ලී කෙළි
D. ශිව පාර්වතී
E. කළගෙඩි නැටුම
F. මුද්‍රා නාට්‍ය
G. රාමායනය

(5) නර්තන අංග ඇතුලත් ඉංග්‍රීසි අක්ෂර කාණ්ඩය වන්නේ
(i) C, G, E (ii) B, F, G (iii) D, E, G (iv) A, C, E

(6) නාට්‍ය අංග ඇතුලත් ඉංග්‍රීසි අක්ෂර කාණ්ඩය වන්නේ
(i) B, D, F (ii) A, B, C (iii) D, D, E (iv) C, F, G

(7) ජනශ්‍රැති කතා පුවතක් අන්තර්ගතව ඇත්තේ
(i) A සහ D වලය ය. (ii) C සහ E වලය ය. (iii) F සහ G වලය ය. (iv) D සහ E වලය ය.

(8) නෘත්ත අභිනයට කථා පුවතක් එකතු වූ විට එය හඳුන්වන්නේ,
(i) නෘත්ත ලෙස ය. (ii) නාට්‍යය ලෙස ය. (iii) නෘත්‍ය ලෙස ය. (iv) නර්තන ලෙස ය.

(9) නාට්‍යයක වේෂභූෂණ භාවිතය තුළින් ඉටු කරගැනීමට අපේක්ෂා නොකරන අරමුණක් වන්නේ,
(i) චරිතයක බාහිර ස්වභාවය පෙන්වීම.
(ii) නළුවාගේ ශරීර ලක්ෂණ පෙන්වීම.
(iii) චරිතයක වයස, තරාතිරම පෙන්වීම.
(iv) වේදිකා දර්ශනයේ ශෝභා සම්පන්න බව මැවීම.

(10) රංග කාර්යයට දායක වන ආනුෂාංගික ශිල්පීන් පමණක් ලෙස සලකන්නේ,

(i) පසුතල, රංගාලෝක, සංගීත
(ii) පෙළ මතක් කරන්නා, රංගාලෝක, වේෂ නිරූපණ
(iii) වේදිකා පාලක, අංග රචනා ශිල්පී, ගර්තගත
(iv) පෙළ මතක් කරන්නා, වේදිකා පාලක, පෙළ රචක

(11) නාට්‍යයක් රඟ දක්වා පෙන්වීමට අවශ්‍ය කරන දෙපාර්ශ්වය වන්නේ,

(i) නළු නිළියන් - අධ්‍යක්ෂක
(ii) පෙළ රචක - අධ්‍යක්ෂක
(iii) නළු නිළියන් - ප්‍රේක්ෂකයෝ
(iv) අධ්‍යක්ෂක - ආනුෂාංගික ශිල්පීන්

(12) රූපන කාර්යයේදී නළුවා විශේෂයෙන්ම ප්‍රගුණ කළ යුතු අංශ දෙක වන්නේ,

(i) අනුකරණය සහ අනුරූපනය.
(ii) ආංගික අභිනය හා වාචික අභිනය.
(iii) සමාරෝපය සහ අනුකරණය.
(iv) අභ්‍යන්තර ප්‍රකාශනය සහ බාහිර ප්‍රකාශනය.

(13) පත්තර පිටු කිහිපයක් කුඩා දූපත් ලෙස සලකමින් එක් ළමයෙක් මෝරකු ලෙස පෙනී සිටිමින් ද සිදුකරන රංග ක්‍රීඩාව මගින් සිසුන්ට ලැබෙන ප්‍රයෝජනයක් විය හැක්කේ,

(i) රූපන හැකියාව වර්ධනය වීම.
(ii) අවධානයෙන් කටයුතු කිරීමේ හැකියාව.
(iii) මුහුදු ගමන් පිළිබඳව අවබෝධයක් ලැබීම.
(iv) ගායන හා නර්තන හැකියාව දියුණු වීම.

(14) පරිකල්පනය දියුණු වීම, සාමූහිකත්වය හා රංග කුසලතා වර්ධනය සඳහා වඩාත් සුදුසු රංග අභ්‍යාසය ලෙස සැලකිය හැක්කේ,

(i) ක්‍රීඩනික නිරූපණයේ යෙදීමයි.
(ii) ස්වසන අභ්‍යාසවල යෙදීම යි.
(iii) ගායන ව්‍යායාම වල යෙදීමයි..
(iv) ශිථිලකරණ අභ්‍යාසවල යෙදීමයි.

(15) අම්මෝ, දෙවියනේ, කොයින්දෝ වැනි වචන භාවිතා කරමින් හුස්ම පිට කරන රංග අභ්‍යාස විශේෂය,

(i) කටහඬ අභ්‍යාසය යි.
(ii) ස්වසන අභ්‍යාසයි.
(iii) සංවේදන අභ්‍යාසයි.
(iv) ශිථිලකරණ අභ්‍යාසයි

- පහත සඳහන් ප්‍රකාශ ආශ්‍රය කරගෙන ප්‍රශ්න අංක 16 සිට 19 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

P ගුරුවරයා බී තැබැල්ල විවිධ පැතිවලට හැරවීම සිදුකරන විට ළමුන් ඒ ඒ පැති දෙසට නෙත් යොමු කරයි.
Q ජනේලයක් හෝ දොරක් ඇරෙන හඬ ඇසයි.
R සුවඳ විලවුන් ගෑල් වූ පුළුන් කැබැල්ලක් පැණි කාමරයේ කොනක සඟවා ඇත.
S සිසුවෙකු නෙල්ලි ගෙඩියක් කන ආකාරය කරමින්න.
T දෑස් බැඳ ඇති සිසුවෙකුට විවිධ සෙල්ලම් බඩු ස්පර්ශ කර හඳුනා ගැනීමට දෙන ලදී.
U ඔබ උදෑසන පිබිදීමේ සිට මේ දක්වා කළ ක්‍රියාකාරකම් දෑස් පියාගෙන සිහිපත් කරන්න.

(16) දිව සම්බන්ධ සංවේදන අභ්‍යාසයක යෙදෙන විට සිදු කරනු ලබන ක්‍රියාකාරකමක් අඩංගුව ඇත්තේ,

(i) R වලය. (ii) S වලය. (iii) T වලය (iv) U වලය.

(17) ඇස හා කන පිළිබඳව සංවේදන අභ්‍යාස ක්‍රියාකාරකම දැක්වෙන්නේ

(i) T සහ U වලින් (ii) S හා Q වලින් (iii) Q සහ S වලින් (iv) P සහ Q වලින්

(18) R ප්‍රකාශය මගින් ඉදිරිපත් කරන්නේ

(i) සිරුර සම්බන්ධ සංවේදන අභ්‍යාසයයි.
(ii) කන සම්බන්ධ සංවේදන අභ්‍යාසයයි.
(iii) නාසය සම්බන්ධ සංවේදන අභ්‍යාසයයි.
(iv) අවධානය සම්බන්ධ සංවේදන අභ්‍යාසයයි.

(19) T ප්‍රකාශය මගින් ඉදිරිපත් වන්නේ,

(i) ඇස හා ශරීරය සම්බන්ධ සංවේදන අභ්‍යාසයි.
(ii) ශරීරය සම්බන්ධ සංවේදන අභ්‍යාසයි.
(iii) නාසය සහ ඇස සම්බන්ධ සංවේදන අභ්‍යාසයි.
(iv) දිව සහ නාසය සම්බන්ධ සංවේදන අභ්‍යාසයි.

- පහත දැක්වෙන වගුව ආශ්‍රය කරගෙන අංක 20 සිට 24 දක්වා වූ ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| නාට්‍යකරු | මුල් කෘතියේ නම | පරිවර්තනයේ නම | අනුවර්තනයේ නම | ස්වතන්ත්‍ර රචනයේ නම | චරිත (උදාහරණ |
|---|---|---|---|---|---|
| A | කොකේසියන් චෝක්සර්කල් | B | | | ගෲෂා |
| C | | | | පුස්ලොඩං | |
| බන්දුල ජයවර්ධන | ඉන්තෙවුරා ම | | D | | |
| E | "ද හෝස්" | තුරඟ සන්නිය | | | |
| F | | | | G | සුප්පා දේවිය |

(20) ගෲෂා යන ප්‍රධාන චරිතය සහිත නාට්‍යයේ පරිවර්තිත නම සහ පරිවර්තකයා වන්නේ

(i) මරාසාද්, සුගතපාල ද සිල්වා
(ii) ධවල භීෂණ, ධර්මසිරි බණ්ඩාරනායක
(iii) හුණුවටයේ කතාව, හෙන්රි ජයසේන
(iv) ධූ ධූ ලෙබර්, ඩග්ලස් රණසිංහ

(21) "C" අක්ෂරයෙන් ප්‍රකාශ වන නාට්‍යකරුවා වන්නේ

(i) සයිමන් නවගත්තේගම
(ii) ශ්‍රියන්ත මෙන්ඩිස්
(iii) ජැක්සන් ඇන්තනි
(iv) සුගතපාල ද සිල්වා

(22) බෙරහඬ නම් නාට්‍ය සඳහන් විය යුත්තේ.

(i) G වලය. (ii) D වලය. (iii) B වලය. (iv) මේ එකක්වත් නොවේ.

(23) "සුප්පා දේවි" යන ප්‍රධාන චරිතය ඇතුළත්ව ඇති නාට්‍ය කෘතිය විය හැක්කේ

(i) කුවේණි
(ii) අපට පුතේ මඟක් නැතේ
(iii) ලියතඹරා
(iv) සිංහබාහු

(24) E අක්ෂරයේ සඳහන් විය යුතු නාට්‍යකරුවා නම්

(i) ජයලත් මනෝරත්න
(ii) කෞශල්‍යා ප්‍රනාන්දු
(iii) සුගතපාල ද සිල්වා
(iv) දයානන්ද ගුණවර්ධන

(25) ශෛලිගත සම්ප්‍රදායෙන් දෛනික ජීවන ප්‍රශ්න කථා කළ හැකි බව ප්‍රථම වරට පෙන් වූ නාට්‍ය වන්නේ.

(i) කුවේණි (ii) ජනේලය (iii) මනමේ (iv) සඳ කිඳුරු

(26) "සොඳුරු ආලෝදායකයා" යනු

(i) චිත්‍රපටයක නමකි.
(ii) වේදිකා නාට්‍යයක නමකි.
(iii) ප්‍රසිද්ධ චිත්‍රයක නමකි.
(iv) පොතක නමකි.

(27) ලංකාවේ සම්මත රංගන ක්‍රමය වෙනස් කරමින් නාට්‍ය රඟ දැක්වීම් යෙදුයේ

(i) ජන තරුණ නාට්‍ය කණ්ඩායම
(ii) වර්ක් ෂොප් ථියටර් කණ්ඩායම
(iii) අපේ ඇක්ටර්ස් නාට්‍ය කණ්ඩායම
(iv) දිරිය දරුවෝ නාට්‍ය කණ්ඩායම

(28) හාස්‍ය රංගනය සඳහා ප්‍රකටව සිටි නාට්‍යකරුවකු වන්නේ

(i) ශ්‍රියන්ත මෙන්ඩිස් (ii) ජයලත් මනෝරත්න (iii) විජය නන්දසිරි (iv) ඩග්ලස් රණසිංහ

(29) වේදිකා නාට්‍ය, සිනමා, ටෙලි නාට්‍ය යන ත්‍රිත්වය තුළම සිය නිර්මාණ දායකත්වය දක්වන්නේ ගැති ශිල්පියා විය හැක්කේ.

(i) ජැක්සන් ඇන්තනි
(ii) විජේරත්න වරකාගොඩ
(iii) පරාක්‍රම නිරිඇල්ල
(iv) රාජිත දිසානායක

(30) වේදිකා නාට්‍ය කෘති පමණක් සඳහන් ව ඇත්තේ
(i) සරිගම, හඳයා, රාජ තන්තුරු
(ii) වරන්ත්‍රප්, තට්ටු ගෙවල්, කැළණි පාලම
(iii) ලුඩුවප්නා මානය, හෝ ගානා පොකුණ, අබ සහල්වෝ
(iv) පණ්ඩුකාභය, මොණර පිල්, අබා

(31) නිවැරදි සම්බන්ධතාව වන්නේ
(i) දිකිරි දිකිරි -රතු හැට්ටකාරි
(ii) වැල් පාලමේ ගීතය - කැළණි පාලම
(iii) ප්‍රේමයෙන් මන රංජිත වේ - සිංහබාහු
(iv) හනික වරෙව් කොල්ලනේ - මූදු පුත්තු

(32) අංග රචනයේදී මුහුණ ප්‍රධාන වශයෙන් කොටස් 6කට බෙදේ. එම කොටස් 6ට අයත් නොවන කොටසක් ඇතුලත්ව ඇත්තේ ,
(i) නළල, කට,නිකට, යන කොටස් වලය.
(ii) කම්මුල්, නාසය, කට යන කොටස් වලය.
(iii) කට, තොල්, නිකට යන කොටස් වලය.
(iv) නළල, කම්මුල්, නාසය යන කොටස් වලය.

(33) පෑන් කේක්, හෝප් පොට්, ස්ට්‍රිට් ගම් යොදා ගන්නේ
(i) වේදිකා පසුතල සකස් කිරීම සඳහා ය.
(ii) වේෂභූෂණ නිර්මාණය සඳහා ය.
(iii) වේදිකා පාලන කටයුතු සඳහා ය.
(iv) අංග රචනය සඳහා ය.

(34) රංගනයේදී නළු නිළියන් අත දරා සිටින්නේ
(i) පසු තලය (ii) රංගෝපකරණ ය. (iii) ඇඳුම් පැළඳුම් ය. (iv) නාට්‍ය පිටපත ය.

(35) නාට්‍යමය අවස්ථාවක් යනු
(i) චරිත කිහිපයක ක්‍රියාකාරීත්වයක් තිබීම.
(ii) නාට්‍යයේ අවසන් දර්ශනය
(iii) යම්කිසි ගැටුමක් සහිත අවස්ථාවක් තිබීම.
(iv) හාස්‍ය හා උපහාසය අන්තර්ගත අවස්ථාවක් වීම.

(36) 2017 වර්ෂයේ ජාතික නාට්‍ය උළෙලේ හොඳම නාට්‍ය ලෙස සම්මානයට පාත්‍ර වූයේ
(i) අකිල සපුමල්ගේ "ගිරිතුඩු කාශ්‍යප"
(ii) ප්‍රියංකර රත්නායකගේ "ප්‍රේම වන්ත කුමාරයෝ"
(iii) අනුර විතානආරච්චිගේ "මාර හොරු"
(iv) රාජිත දිසානායකගේ "ගැටිවම බැරි මිනිහෙක්"

(37) ලෝක නාට්‍ය දිනය
(i) මාර්තු 26 ය. (ii) මාර්තු 27 ය. (iii) මාර්තු 28 ය. (iv) මාර්තු 29 ය.

(38) නාට්‍ය කලාව ප්‍රභවය ඇති වූයේ.
(i) එංගලන්තයේ (ii) ඉන්දියාවේ (iii) ඉතාලියේ (iv) ග්‍රීසියේ ය.

(39) සංවාද රචනයේ දී අවධානය යොමු නොකළ යුත්තේ
(i) භාව ප්‍රකාශනය ගැන ය.
(ii) උච්චාරණය පිළිබඳවයි.
(iii) හඬ මිහිරි ලෙස භාවිතා කිරීම ගැන ය.
(iv) චරිත ස්වභාවය මතු කිරීම ගැන ය.

(40) රූපණ කාර්යය වේදිකා නාට්‍යයකදී ඉතා හොඳින් ඉදිරිපත් කල බවට නළුවා තුළ විශ්වාසයක් ගොඩනැගෙන්නේ
(i) අධ්‍යක්ෂකවරයා ප්‍රශංසා කිරීමෙනි.
(ii) දීර්ඝ පුහුණුවක් ලද හෙයින්
(iii) නළුවාටම තම රූපණය පිළිබඳව ඇති වැටහීමෙන්
(iv) ධනාත්මක ප්‍රේක්ෂක ප්‍රතිචාර මගින්

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2017

### 10 ශ්‍රේණිය

## නාට්‍ය හා රංග කලාව - II පත්‍රය

නම/විභාග අංකය :- ........................................................................................ කාලය : පැය 02 යි.

- ❖ පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.
- ❖ අනෙකුත් ප්‍රශ්න අතුරින් 4ක් තෝරාගෙන, පළමු ප්‍රශ්නයද ඇතුළුව ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.

(1) මෙම නාට්‍යමය පැවැදි කොටස ඇසුරු කරගෙන පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- දශ්ශිය - දශ්ශිය - දශ්ශිය - ගහ ගස්මුරය බොරු දොඩමින
  විය මග ගෙර - අද මගෙ සොරකම් කරගෙන
  පන්නේ තිමිද දැන්
  කරගෙන යන්නේ සිම ද දැන්

- වියරුද - වියරුද - වියරුද - අගුළුමිටිය
  මෙළඳ මගෙය - සුවාමි ඉලය දැන් - සමතයාමි
  සුවාමි ඉලය දැන්
  (ගෝලයා පැමිණෙයි)

(i) ඉහතින් දැක්වෙන පැවැදිය අයත් නාට්‍යයේ නම සහ රචකයාගේ නම සඳහන් කරන්න. (ලකුණු 2)
(ii) මෙම පැවැදි කොටස ඇසු ඉදිරිපත් කරන චරිත දෙකෙහි නම් සඳහන් කරන්න. (ලකුණු 2)
(iii) මෙම පැවැදි ගායනය දෙකට අදාළ අවස්ථාව පිළිබඳව කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 4)
(iv) එම නාට්‍යයට පසුබිම් වූ කථා පුවත කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 4)

(2) නාට්‍යයක් නැරඹීම මගින් ප්‍රේක්ෂකයා සම්බන්ධ සත්‍යවත් සිද්ධියක් හෝ තත්ත්වයක් පිළිබඳව වැටහීමක් ලබාගනී.
(i) කතාන්දරයක් යනු කුමක්දැයි කෙටියෙන් දක්වන්න. (ලකුණු 3)
(ii) නාට්‍යයක් යනු කුමක්දැයි පහදන්න. (ලකුණු 3)
(iii) නාට්‍යයක සහ කතාන්දරයක සමාන හා අසමාන ලක්ෂණ පිළිබඳව කෙටි පැහැදිලි කිරීමක් කරන්න. (ලකුණු 6)

(3) භරත මුනිවරයා සිය නාට්‍ය ශාස්ත්‍රය නම් ග්‍රන්ථයෙන් ප්‍රධාන නාට්‍ය ශෛලීන් දෙකක් පිළිබඳව පැහැදිලි කිරීමක් කරයි.
(i) එම නාට්‍ය ශෛලීන් දෙක නම් කරන්න. (ලකුණු 2)
(ii) නාට්‍ය ශෛලීන් දෙකට අයත් විය හැකි නාට්‍ය දෙක බැගින් සඳහන් කරන්න. (ලකුණු 4)
(iii) මෙම නාට්‍ය ශෛලීන් දෙකෙහි දැකිය හැකි විශේෂ ලක්ෂණ 3 බැගින් සඳහන් කරන්න. (ලකුණු 6)

(4) රූපන කාර්යයේදී නළුවා සිය චරිතයට අදාළව විවිධාකාරයේ ක්‍රියාකාරකම් වල යෙදීමට සිදු වේ. රූපනය සාර්ථක කර ගැනීමට එම චලනයන් පුහුණු කිරීම ඉතා වැදගත් වේ.
(i) රූපන කාර්යයේදී නළුවා භාවිතා කරන චලන වර්ග 3ක් නම් කරන්න. (ලකුණු 3)
(ii) එම චලන වර්ගවලින් දෙකක් පිළිබඳව කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 4)
(iii) සැමනි චලන වර්ගයක් පුහුණුවීම සඳහා ඔබට භාවිතා කළ හැකි චලන අභ්‍යාසයක් කෙටියෙන් ලියා දක්වන්න. (ලකුණු 5)

(5) (i) පහතරට ප්‍රදේශයේ ප්‍රචලිත ශාන්තිකර්ම 3ක් නම් කරන්න. (ලකුණු 3)
(ii) ශාන්තිකර්ම වල දැකිය හැකි නාට්‍යමය ලක්ෂණ 4ක් සඳහන් කරන්න. (ලකුණු 4)
(iii) ඉහතින් සඳහන් කළ ශාන්තිකර්ම වලින් දැකිය හැකි අන්තරාංග අවස්ථා 2ක් නම් කර ඒවායේ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 5)

(6) හැසුම්, වැසුම්, රඟුම් ඉදිරිපත් කරන ස්ථානයට රංගභූමිය යැයි කියති. රංග භූමිය නාට්‍ය කලාව ආරම්භ වීමට පෙර සිටම ඇතිව තිබිය.

(i) අතීතයේ ලංකාවේ රංගභූමි ලෙස භාවිතා කළ ස්ථාන 2ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ii) රංග භූමියක තිබිය යුතු මූලික ලක්ෂණ 4ක් සඳහන් කරන්න. (ලකුණු 4)

(iii) වර්තමානයේ පවතින රංග භූමි වර්ගයක් නම් කර ඒ පිළිබඳව කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 6)

(7) "උදෑසන 5ට පමණ ලැබුණ දුරකථන ඇමතුමෙන් නිවසේ සියළු දෙනාම අවදි විය. රිසීවරය ගත් විට එහි අනෙක් පසින් ප්‍රකාශ කරනවා ඇසුනේ අ.පො.ස. (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල අන්තර්ජාලයට මුදා හැර ඇත බව ය. ලොකු පුතා ඉතා සාර්ථක ලෙස විභාගයට පෙනී සිටි බැවින් ඔවුන් වහ වහා පරිගණකය ඇති කාමරයට ගියේ ප්‍රතිඵලය බැලීමට ය......"

මෙතැනින් පසු සිදුවිය හැක්කේ කුමක්දැයි යන්න පරිකල්පනය කර කෙටි නාට්‍ය පිටපතක් රචනා කරන්න.